"පුංචි ඡන්දය වසරකින් කල් යයි!" යන සිරස්තලයෙන් යුතුව මව්බිම පුවත්පතේ (09/26) පළ වූ පුවත් වාර්තාවකින්, පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් තොරතුරු දක්වා තිබිණි. කෙසේ නමුත්, එම පුවත් අන්තර්ගතයේ සඳහන්ව තිබුණේ, පළාත් පාලන මැතිවරණය තව වසරකින් කල් දැමීම කෙරෙහි "රජයේ ප්‍රධානීන්ගේ අවධානය යොමු වී ඇතැයි වාර්තා වන" බවයි.

මෙම සිරස්තලය සහ පුවත් අන්තර්ගතය සලකා බලන විට, තවමත් ස්ථිර වශයෙන් තීන්දු වී නොමැති කරුණක්, ස්ථිර වශයෙන්ම තීන්දු කෙරී ඇතැයි යන අදහස මෙම පුවත් සිරස්තලයෙන් ලබා දෙන්නේ යැයි ඔබ සිතන්නේද? එය එසේ යැයි ඔබ සිතන්නේ නම්, එය පාඨකයා නොමඟ යැවීමක් ලෙසින් ගත හැකිද?

එම සිරස්තලය "පුංචි ඡන්දය වසරකින් කල් යයි?" ලෙසින් විශ්මයාර්ථය වෙනුවට ප්‍රශ්නාර්ථයක් සමඟින් යෙදුණේ නම්, පුවත් අන්තර්ගතය හා එය සැසඳෙනු ඇතැයි ඔබ නොසිතන්නේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima**